**ශ්‍රී ලංකා රග්බි ආයතනය - 2022**

**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා රග්බි (“ශ්‍රී ලංකා රග්බි”) ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා රග්බි ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ශ්‍රී ලංකා රග්බි ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනයඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ශ්‍රී ලංකා රග්බි ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා රග්බි ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4. විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ශ්‍රී ලංකා රග්බි ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ශ්‍රී ලංකා රග්බි ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ශ්‍රී ලංකා රග්බි ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ශ්‍රී ලංකා රග්බි ආයතනයේ ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම.**

| | අදාළ ප්‍රමිතවලට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සුළු සහ මධ්‍ය පරිමාණ ආයතනයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 17:19 වගන්තියට අනුව පිරිවැය රු. 273,347 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපළ පිරියත හා උපකරණවල අවශේෂ අගය , ක්ෂය කරන ක්‍රමය හෝ ප්‍රයෝජනවත් ජීවිත කාලය සංශෝධනය කර නොතිබුණි. | එකඟ වේ. | ගිණුම් කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කළ යතුය. |
| (ආ) | සුළු හා මධ්‍ය පරිමාණ ආයතනයන් සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 17.31 ඡේදය ප්‍රකාරව ලී බඩු හා සවි කිරීම් සියයට 10 කින් ක්ෂය කර තිබුණද ක්ෂය අනුපාතය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | එකඟ වේ | ගිණුම් කරණ ප්‍රමිත ප්‍රකාරව ක්ෂය ප්‍රතිපත්තිය හෙළිදරව් කිරීමට කටයුතු කළ යතුය. |

**1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | අයිතමය | මුදල රු. | ලබාදී නොමැති සාක්ෂිය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | වියදම් | 14,460,500 | ගෙවීම් වවුචර් හා අදාළ ලේඛන | අදාල වවුචර්පත් විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | මෙම අයිතම් ඉදිරියේ දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ලැබිය යුතු ශේෂ | 15,827,184 | ශේෂ සනාථ කිරීම් | මෙම ලැබිය යුතු මුදල් වල ඇතුලත් අනුග්‍රහක මුදල් 2023 වර්ෂයේ දී සංගමයට ලැබී ඇත. | |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ගෙවිය යුතු ශේෂ | 37,522,801 | ශේෂ සනාථ කිරීම් | 2022 වර්ෂයේ දී ගෙවිය යුතු වටිනාකමෙන් අයිතමයන් විශාල ප්‍රමාණයක් ඇත්තේ වෙන් කිරීම වේ.එයට අදාළ ආකෘති පත්‍රයක් අමුණා ඔබ ආයතනයට ඉදිරිපත් කර ඇත. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වම | නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2016 ඔක්තෝබර් 27 දිනැති අංක 1990/23 දරණ ගැසට් පත්‍රයේ රෙගුලාසි වල iii කොටසේ අංක 07 හි (xv) වගන්තිය සඳහා වූ 2020 මාර්තු 10 දිනැති අංක 2166/09 දරණ සංශෝධිත ගැසට් පත්‍රය සහ ශ්‍රී ලංකා රග්බි ව්‍යවස්ථාවේ 21.1(d) හා 33.9 වගන්තිය. | පෙර වර්ෂය සම්බන්ධ විගණිත මූල්‍ය ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනය සම්බන්ධයෙන් වූ විගණකාධිපති වාර්තාව සමඟ වාර්ෂික වාර්තාව සිය වාර්ෂික මහා සභා රැස්වීමේදී හෝ විශේෂ මහා සභා රැස්වීමකදී සභාගත කල යුතු වුවද 2021 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. | විගණකාධිපති වාර්තාව සමඟ විගණිත මූල්‍ය ප්‍රකාශන මහා සභා රැස්වීමකදී සභාගත කිරීමට අප්‍රමාදව කටයුතු කල යුතුවේ |
| (ආ) | 2016 ඔක්තෝම්බර් 27 දිනැති අංක 1990/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ II කොටසේ 5,(4) (ජ) ඡේදය | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු නොකර 2022 අගෝස්තු 27 දින රග්බි ආයතන නිලවරණයේදී, 2022 ජුනි 22 දින තහනම් නියෝගයකට භාජනය වී එම කාලය ගත කරමින් සිට හිටපු සභාපතිවරයා නිලවරණයට ඉදිරිපත් වී සභාපති ධූරයට පත්වී තිබුණි. | නඩු කටයුත්තක් පවතින බැවින් මේ වන විටත් නඩු තීන්දුවක් ලැබී නොමැති නිසා වැඩිදුර අදහස් ප්‍රකාශ කිරීමට නොහැක. | සංගම්වලට සාමාජිකයින් පත්කිරීමේදී පවතින නීතිරීති වලට අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | අංකDSD/NSA/COM – 01/2021 දරන හා 2021 දෙසැම්බර් 17 දිනැති ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් විසින් ජාතික ක්‍රීඩා සංගම් පිළිබඳ නිකුත් කරන ලද මාර්ගෝපදේශ සංග්‍රහයේ | | | |

| | | | | |
|---|---|---|---|---|
| | (i) 3 (iii) වගන්තිය | ක්‍රීඩා සංගමයක පවත්වාගෙන යා හැකි නිල ජංගම බැංකු ගිණුම් සංඛ්‍යාව 02 ක් වුවද ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ එකඟතාවය ලබා නොගෙන බැංකු ගිණුම් හතරක් පවත්වා තිබුණි. | ඉදිරියේදී අතිරේක ගිණුම් දෙක සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවසර ලබා ගැනීමට කටයුතු කරමි. | අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| | (ii) 3.(xiv) වගන්තිය | රු. 3,707,087 ක් වූ ස්ථාවර වත්කම් හා රු. 700,981 ක් වූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ පිළිබඳව භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | පෙර වර්ෂවලදී භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඔබට ලබා දී ඇත. ආයතනය අමාත්‍යාංශය මගින් වසා ඇති බැවින් එය සිදු කිරීමට සංගමයට නොහැකි විය. | මේ වන විට සමීක්ෂණය සිදු කල හැකි බැවින් ඒ සඳහා කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රග්බි ව්‍යවස්ථාවේ 16,17 සහ 18 වගන්ති | බස්නාහිර හා ඌව පළාත් රග්බි සංගම් වල සාමාජිකත්වය ශ්‍රී ලංකා රග්බි සංගමය විසින් අහෝසි කර ඇති බව දන්වා තිබුණි. එසේ තිබියදී එම සංගම් 2022 අගෝස්තු 27 දින රග්බි නිලවරණය සඳහා සහභාගි කර ගෙන තිබුණි. තවද මෙම සංගම් වෙත 2022 දෙසැම්බර් 29 දින එක් සංගමයකට රු. 100,000 බැගින් රු. 200,000 ක් මූල්‍යමය ආධාරද ලබා දී තිබුණි. | රග්බි ක්‍රීඩාවේ උන්නතිය හා ක්‍රීඩකයන්ගේ අභිවෘද්ධිය තකා සංගමය මගින් එම පළාත්වල රග්බි සංවර්ධන කටයුතු සඳහා මෙම මුදල් ලබාදී තිබේ. | ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කළ යුතුය. |

**1.7. ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.7.1 ලැබිය යුතු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලැබිය යුතු ගිණුම් වල ඇතුලත් වසර 06 කට වඩා පැරණි ක්‍රීඩා සංවර්ධන කටයුතු සඳහා පලාත් සංගම් 02 ක් වෙත ලබා දුන් රු. 1,214,473 ක් වූ අත්තිකාරම් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේදී මෙම සංගම් දෙකේ අත්තිකාරම් නිරවුල් කිරීමට සංගමය කටයුතු කරනු ලැබේ. | කල් ඉකුත් වූ අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.7.2 ගෙවිය යුතු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගෙවිය යුතු ගිණුම්වල ඇතුලත් වසර 1-2 අතර පැරණි ශේෂය රු. 3,534,382 ක්ද , වසර තුනකට වඩා පැරණි ශේෂය රු. 31,154,768 ක් ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී තරගාවලි වැඩි වශයෙන් සංවිධානය කර තවත් අනුග්‍රහකයන් සොයාගෙන මෙම මුදල් නිරවුල් කිරීමට සංගමය කටයුතු කරනු ලැබේ | ණයහිමි ශේෂ නිරවුල් කිරීම සඳහා පවත්නා බැදීම් සොයා බලා ඒ අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 වර්ෂයේ සිට පැවත එන ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල් අධිභාර රු. 53,000 ක් හා 2021 වර්ෂයේ සිට පැවත එන ගෙවිය යුතු සේවක වන්දි රු. 1,000,000 ක් සමාලෝචිත වර්ෂයේ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | සේවක භාරකාර අරමුදල් දැනටමත් සංගමය විසින් ගෙවා ඇති අතර පාරිතෝෂිත මුදල් ගෙවා නොමැත. | නියමිත දිනට සේවක භාරකාර අරමුදල් ගෙවීමට කටයුතු කළ යුතු අතර ගෙවීමට ඇති සේවක වන්දි මුදල් ද ගෙවීමට කටයුතු කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,810,997 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.658,202 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,469,199 ක පිරිහීමක් නිරීක්ෂණය විය. රු.5,123,841ක විනිමය හුවමාරු අලාභය මෙම පිරිහීමට හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාස 06 කට වඩා පැරණි එකතුව රු. 45,000 ක් අගය වූ චෙක්පත් 07 ක් අවලංගුකර නව චෙක්පත් නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | මාස 6කට වඩා කල් ඉකුත් වූ චෙක්පත් අවලංගු කර නැවත නිකුත් කිරීමක් සිදු කරනු ලැබේ | නැවත චෙක්පත් නිකුත් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ආසියානු රග්බි සංගමය විසින් ශ්‍රී ලංකා රග්බි සංගමය වෙත 2022 ජුනි 22 දින පනවා තිබූ තහනම් නියෝගය හේතුවෙන්, 2022 වර්ෂයේදී රටවල් දෙකක පැවති ආසියානු පිරිමි හා කාන්තා තරඟය වෙනුවෙන් ශ්‍රී ලංකා රග්බි සංගමයට රු.30,783,149 ක වියදමක් දැරීමට සිදු වී තිබුණි. තවද මෙම තරඟයට සහභාගී වී තිබුණේ ජාතික ධජය යටතේ නොව ඔලිම්පික් ධජය යටතේය. | මෙයට අදාල විමර්ශනයක් පවතින බැවින් අදහස් ප්‍රකාශ කළ නොහැක. | ආසියානු ක්‍රීඩා සංගමයේ අනුග්‍රහය ලබාගෙන ජාත්‍යන්තර තරඟ සඳහා සහභාගී වීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අවශ්‍යතාවය සලකා බලා තොග සපයාගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන්2022 දෙසැම්බර් 31 දිනට වසර පහකට වඩා පැරණි රු.147,185 ක් වූ තොග පැවතුණි. | ඉදිරියේදී වාර්ෂික සභා රැස්වීමකදී අනුමැතිය ගෙන 2023 වර්ෂයේ දී බෙදා දීමට කටයුතු කරමි. | අවශ්‍යතාවයට අනුව මිලදී ගැනීම සිදු කළ යුතුය. |